# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 55 — 1973 අප්‍රේල් 11 වැනි බදාදා — 1973.04.11

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 481 | ආණ්ඩුවේ හොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් ... ... | 484 | රට කිරීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 486 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| ෆොටෝපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


සැළකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 14 දරන අධිකරණ භාෂා (විශේෂ විධිවිධාන) පනත 1973 අප්‍රේල් මස 11 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

යොමු අංකය: සිඩී/42/65.

ටෙන්ඩර් දැන්වීමයි

කොළඹ මහා රෝහලේ ඇති පයින්ට් එක ප්‍රමාණයේ ප්ලාස්ටික් තීස් සේලයින් බෝතල් 15,000 ක් පමණ විකිණීම සඳහා කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරි විසින් 1973.5.24 වන දින උදේ 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. මෙම තීස් සේලයින් බෝතල් තොගය මිලදී ගැනීම සඳහා සුදුසුකම් ලබන්නා විසින් එකවර මුදල් ගෙවා ඒවා ආයතනයෙන් බැහැර ගෙන යා යුතුය. සාර්ථකවූ ටෙන්ඩර්කරුගේ ටෙන්ඩරය පිළිගත් බව දැන්වීමෙන් දින 3 ක් ඇතුළත දී මුළු මුදලම ගෙවා මෙම තීස් සේලයින් බෝතල් තොගය ඉවතට ගෙනයා යුතුය. මුළු තොගය සඳහාම තමා ගෙවනු ලබන මුදල ටෙන්ඩර් පතේ සඳහන් කළයුතු අතර ටෙන්ඩර් පත පිටපත් 2 කින් යුතුව ඉදිරිපත් කළ යුතුය.

3. ඉදිපත් කරන ටෙන්ඩර් පත බහාලන ලියුම් කවරයේ වම්පස කෙළවරේ "තීස් සේලයින් බෝතල් මිලදී ගැනීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කර, 1973 මැයි මස 24 වන දින පෙරවරු 10 ට පෙර කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරීට ලැබෙන සේ ලේඛනගත තැපැලෙන් එවීමෙන් හෝ එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීමෙන් හෝ ඔහු වෙත ලැබෙන්න සැලැස්විය යුතුය.

4. 1973 මැයි මස 24 වන දින උදේ 10 ට කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරීන් විසින් මෙම ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත් ඉදිරිපත් කර ඇති සියලුදෙනාම මේ අවස්ථාවේදී පැමිණ සිටිය හැක.

6. මේ පිළිබඳ වැඩි විස්තර කොළඹ මහ රෝහලේ වෛද්‍ය අධිකාරි ගෙන් ලබාගත හැක.

7. මොනම ප්‍රශ්න කිරීමක්වත් නොමැතිව ටෙන්ඩර් පත් සමහරක් හෝ සියල්ලම වුවද ප්‍රතික්ෂේප කිරීමේ බලය ටෙන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

එස්. ඩී. එම්. ප්‍රනාන්දු,
කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී.

1973 මාර්තු 26 වන දින,
කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී කාර්යාලයේදීය.

4-257—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතියකට පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයන්හි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. ඩී. සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

යොමුව : පී.එස්.ඩී. 1/5/73

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

ඒ.සී.ඩී. බෝතල් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ඒ.සී.ඩී. බෝතල් සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(I) විදේශී රටවල නම ගිය නිපදවන්නෝ,

(II) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(III) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ. පෙ. 584 හිමි කොළඹ 10, 385, ඩීන්ස් පාර, අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973 මැයි මස 8 වැනි දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(I) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලින්,

(II) ලංකාවේ විදේශ ආණ්ඩුවල නියෝජිතයින්,

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රෙලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම, ඩෙන්මාර්ක්, ස්විට්සර්ලන්තය ආදි රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබාගන්නා ලෙස ඒජන්ට්වරු සහ නියෝජිත යින් විදේශීය සමාගම්වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට, නියමිත ස්ථාන යේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධ විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබාගත හැක.

ඇන්. කේ. පී. විජේසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, 1973 අප්‍රේල් මස 3 වැනි දින,

අදල උපලේඛනය

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 .. | Sterile A.C.D. Bottles Siliconized with vacuum containing 120 mls. A.C.D. Solution B (U.S.P.) for 480 mls. blood | 50,000 bottles .. | In cartons of 12 bottles |
| 2 .. | Sterile A.C.D. Bottles Siliconized with vaccuum containing 60 mls. A.C.D. Solution B (U.S.P.) for 240 mls. blood | 30,000 bottles .. | do. |
| 3 .. | Disposable Plastic Blood Administration sets—Sterile and Non-pyrogenic with 180 × 1 1/2″ Luer Cone Needle complete with airway | 75,000 sets .. | In cartons of 12 sets |
| 4 .. | Disposable Sterile Plastic Donor Sets with 170 × 2″ Donor Needle Luer Cone and 15 G puncture needle | 75,000 sets .. | do. |

4–306—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කාක් කපල් ලිය බලවේග පේෂකර්ම ව්‍යාපාරයට ජලය සැපයීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්ත මේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 05. 04 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු.18,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 25 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්ත මේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට, 1973. 05. 03 දින පෙ. ව. 12ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පතත් ලබා ගත යුතුවේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්තත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/41).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ, 1.
1973.3.30.

4–260—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ කොටුවේ ලක්සල ගොඩනැගිල්ලේ තීන්ත ගෑම හා පාට ගෑම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973. 05. 08 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 45,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973. 05. 07 දින පෙ. ව. 12 ට පෙර කුවිතාන්සි හා ලියා පදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/42)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 3. 31

4–303—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

රත්තොට බලවේග පේෂකර්ම ආයතනය අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්ත මේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973. [illegible] 9 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 36,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචිවී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 50 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973. 5. 8 දින පෙ. ව. 12 ට පෙර කුවිතාන්සි හා ලියා පදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ..

යොමුව : 3/1—(1/43).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 3. 31

4–304—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### විද්‍යාගාර උපකරණ (වීදුරු බඩු) සැපයීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන පරිදි විද්‍යාගාර උපකරණ සැපයීම සඳහා—

(i) විදේශීය ප්‍රසිද්ධ නිෂ්පාදකයින්ගෙන්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයන්ගෙන්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයන්ගෙන්,

(iv) ඕස්ට්‍රේලියාව, පෝලන්තය, චැකෝස්ලෝවැකියාව, චීන මහජන සමූහාණ්ඩුව, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය, යුගෝස්ලෝවියාව, එක්සත් අරාබි සමූහාණ්ඩුව, බල්ගේරියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව, හන්ගේරියාව සහ රුමේනියාව යන රටවලින් ද ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයෙහි, ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1973 ජූලි මස 11 දින පෙරවරු 10 දක්වා මෙම භාණ්ඩ සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

3. මෙම ටැන්ඩර් කැඳවීමට සම්බන්ධිත ටෙන්ඩර් ආකෘති පත්‍ර, කොන්දේසි ආදිය—

(i) විදේශවල සිටින ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයින් මගින් ප්‍රසිද්ධ නිෂ්පාදකයින්ට ; හා

(ii) ශ්‍රී ලංකාවේ සිටින ඔවුන්ගේ රාජ්‍ය නියෝජිතයන් මගින් 1(IV) පරිච්ඡේදයේ සඳහන් රටවලට ද ලබාගත හැකිය.

4. ඉතාලිය, ඕස්ට්‍රේලියාව, එක්සත් ඇමෙරිකා රාජ්‍යය, බ්‍රිතාන්‍යය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, ඩෙන්මාර්කය, ස්විට්සර්ලන්තය ආදී රටවල සිටින ශ්‍රී ලංකාවේ නියෝජිතයින්ගෙන් මෙම ටෙන්ඩර් කැඳවීමට සම්බන්ධිත ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා වෙනත් සියළුම විස්තර ද ලබාගැනීමට හැකි බැවි ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන නිෂ්පාදන නියෝජිතයනට ඔවුන්ගේ ඒජන්තවරුන් හා නියෝජිතයන් විසින් උපදෙස් දිය යුතුය.

5. ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින්ට ද ඉහත දෙවන ඡේදයේ සඳහන් වන ස්ථානයෙහි හා වේලාවෙහි දී ටෙන්ඩර් විවෘත කරන විට පෙනී සිටිය හැකිය.

6. වැඩිදුර විස්තර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සැපයීම්) කාර්යාලයෙන් ලබාගත හැකිය.

ප්‍රේමදාස උඩගම,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

කොළඹ 2,
1973 අප්‍රේල් මස 2 වැනි දින.

### උපලේඛනය

| *Item No.* | *Quantity* | *B.T.N. No.* | *Description of* | *Packing Required* |
|---|---|---|---|---|
| 1 | 15,000 | 70·17 | Beakers, low form with spout, capacity 50 ml. borosilicate glass | In Cartons of 1 doz. |
| 2 | 15,000 | 70·17 | Beakers, low form with spout, capacity 250 ml. borosilicate glass | do. |
| 3 | 15,000 | 70·17 | Beakers, low form with spout, capacity 400 ml. borosilicate glass, | do. |
| 4 | 2,000 | 70·17 | Measuring cylinders 250 ml. spouted clear, borosilicate glass, subdivisions 2 ml. | do. |
| 5 | 10,000 | 70·17 | Flasks, flat bottomed, long neck, capacity 100 ml. | do. |
| 6 | 10,000 | 70·17 | Flasks, flat bottomed long neck, capacity 500 ml. borosilicate glass | do. |
| 7 | 2,400 | 70·17 | Funnels, 5–6 cum diameter borosilicate glass | do. |
| 8 | 4,800 | 70·17 | Thermometers 0–110° C least count 1 degree | do. |
| 9 | 2,000 | 70·17 | Thermometers, 0–50° C least count 0.5 degree | do. |
| 10 | 4,800 | 70·17 | Watch glasses, 6–8 cm. diameter | In Cartons of ½ gross |
| 11 | 800,000 | 70·17 | Test Tubes, 15 mm. × 70 mm. | In Cartons of ½ or 1 gross |
| 12 | 40,000 | 70·17 | Test Tubes 15 mm. × 150 mm. rimmed, Soda glass. | do. |
| 13 | 40,000 | 70·17 | Test Tubes 25 mm. × 150 mm. rimmed, Soda glass. | do. |
| 14 | 40,000 | 70·17 | Test Tubes 15 mm. × 150 mm. rimmed, borosilicate glass | do. |
| 15 | 40,000 | 70·17 | Test Tubes 25 mm. × 140 mm. rimmed, borosilicate glass | do. |
| 16 | 2,000 | 70·17 | Burettes 0–50ml. o. 1 ml. divisions marked each milli litres marked at least half way round stem, uniform bore of material diamensionally stable. Resistant to mechanical shock and chemical attack lower and provided with tap and jet | In Cartons of 1 doz. |
| 17 | 2,000 | 70·17 | Flask, conical, borosilicate glass, capacity 250 ml. side mouthed | do. |
| 18 | 2,000 | 70·17 | Flask graduated, Range fixed, 250 ml. for students used of diamensionally stable material. Resistant to mechanical shocks and chemical attack and fitted with ground glass stopper | do. |
| 19 | 2,000 | 70·17 | Pipettees, Bulb-type Bore-silicate glass with ground tip and upper end smooth and at right angles to the axis capacity 25 ml. | do. |
| 20 | 1,000 | 70·17 | Pipettees, Bulb-type of borosilicate glass with ground tip and upper ends smooth and at right angles to the axis capacity 10 ml. | do. |
| 21 | 2,000 | 70·17 | Petridishes, diameter 10 cm. borosilicate glass | In Cartons of ½ gross |

*Note.*—Several small cartons containing each category of equipment mentioned above may be packed in one large box.

4–299—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

### හානි වූ බඩු විකිණීම

පහත සඳහන් හානිවූ බඩු මිලයට ගැනීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ :—

හානිවූ කාබන් බ්ලැක් රාත්තල් 7,154
ෆේජ්ඩ් ටෝරස් රථයක හානිවූ ඉදිරි වීදුරුව (වින් ඩ්ස්ක්‍රීන්)
හානිවූ ඇලුමිනියම් සල්ෆේට් රාත්තල් 13,664
හානිවූ ආරක්ෂිත වීදුරු 113
හානිවූ අමු සැප රාත්තල් 811
පිගන් සෑදීමට ගන්නා හානිවූ ගිනි ගඩොල් 107
හානිවූ වීදුරු ආවරණ 269

ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ කොළඹ 1, ගෆ්පූර් ගොඩනැගිල්ලේ, මුහුදු කළමනාකරුගෙන් ලබාගන්නා ෆෝරමයන් මගිනි.

1973 මැයි මස 3 වැනි දින ප. ව. 1.30 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වේ.

කළමනාකරු,
මුහුදු ආරක්ෂක දෙපාර්තමේන්තුව.

4–322—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

### ජාතික ජෙෂකර්ම සංස්ථාව

ඩීසල් ඇන්ජිමකට සම්බන්ධ කරන ලද ජෙනරේටරක් සැපයීම

ඩීසල් ඇන්ජිමකට සම්බන්ධ කරන ලද ජෙනරේටරයක් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ. එක් කට්ටලයක් සඳහා රු. 5 බැගින් ගෙවා පහත අත්සන් කර ඇති අයගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මය සමග විස්තර සපයනු ලැබේ.

1973 මැයි මස 03 වැනි දින ප. ව. 3 ට ටෙන්ඩර් භාරගැනීම අවසන් වේ.

වාණිජ කළමනාකරු.

56, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7.

4–312—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය.

---

### තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

විශේෂ ලියුම් කවර සැපයීම

විශේෂ ලියුම් කවර සැපයීම සඳහා කොළඹ, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ, දෙපාර්තමේන්තු ගැණුම්පත් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973 අප්‍රේල් මස 28 වැනි දින පෙ. ව. 10 වන තෙක් මෙරට නිෂ්පාදකයින්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 1973 අප්‍රේල් මස 28 වැනි දින පෙ.ව. 10.05 ට ටෙන්ඩර් විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන වේලාවේදී පැමිණ සිටිය හැක.

3. කොළඹ, නාරාහේන්පිට පිහිටි තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ උපකරණ—ගොඩනැගිලි—සුහසාධක හා ගබඩා කටයුතු පිළිබඳ සහකාර අධිකාරී කාර්යාලයෙන් නිකුත් කරන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර ද එම කාර්යාලයෙන් දැනගත හැක. ප්‍රධාන තැපැල් කාර්යාලයේ අංක 4 දරණ කවුළුවේ රු. 50 ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ආකෘති පත්‍ර ලබා ගත හැක. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1973 අප්‍රේල් මස 11 වැනි දින සිට 1973 අප්‍රේල් මස 27 වැනි දින ප. ව. 3.30 දක්වා නිකුත් කරනු ලැබේ.

4. අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීම නිර්දේශ නොකරන බැවින්, ටෙන්ඩර් පත් භාර ගනු ලබන්නේ අමුද්‍රව්‍ය ලබාගැනීම සඳහා ආනයන බලපත් මෙම දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට බලාපොරොත්තු නොවන කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණි.

ඒ. ආර්. ඇම්. ජයවර්ධන,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

4–310—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා ගමනාගමන මණ්ඩලය

1973.03.16 වෙනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ පළ කරන්නට යෙදුන ටෙන්ඩර් දැන්වීම අනුව පහත සඳහන් වැඩ පිළිබඳ ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය හා ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේ අවසාන දිනය පහත පෙන්වා ඇති අයුරු දීර්ඝ කර ඇති බැව් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන්නන්ගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිමි. තවද, වැඩ අංක : ඉසි/529 සඳහාවූ අවම ලියාපදිංචි සීමාව රු. 7,50,000 දක්වා අඩුකර ඇත.

ඉසි/529 හාරගම ඩිපෝවේ ගොඩනැගිලි තැනීම — ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය 73.05.24 දින පෙ. ව. 10 දක්වා.

ඉසි/530 හාරගම ඩිපෝවේ ප්‍රාදේශීය ගොඩනැගිලි තැනීම — ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමේ අවසාන දිනය : 73.05.23 දින දහවල් 12 දක්වා.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන.

නො. 200,
කිරුළ පාර, කොළඹ 5.

4–3[illegible]—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

## තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය

1972 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1973 දෙසැම්බර් මස 31 වෙනිද දක්වා වූ කාලය තුලදී ශ්‍රී ලංකා යුද්ධ හමුදවට පලාපු දර සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීමෙන් අනතුරුව, යුද්ධ හමුද ටෙන්ඩර් මණ්ඩලය විසින් තෝරා පත්කර ගන්නා ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නම, ලිපිනයන් සහ සේවා ස්ථානයන් මෙසේය :—

| කොන්ත්‍රාත් කරුගේ නම සහ ලිපිනය | සේවා ස්ථානය |
|---|---|
| වික්‍රමරත්නස් මහත්වරු, අංක 212/49ඊ, හැස් කර්මාන්ත වීදිය, කොළඹ 11 | මන්නාරම |
| එම | සිලාවතුරය |
| එච්. ටී. ජිනදස මහතා, ජයනන්ද හෝටලය සහ බේකරිය, කිලිනොච්චිය | වෙම්පන්කුණ්ඩු |
| එම | එලිෆන්ට්පාස් |
| එම | මුලතිව් |
| එස්. එස්. සෙල්වදෙරේ මහතා, අංක 83, 1 වෙනි මරදන, කොළඹ 10 | යාපනය. |

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුදහමුදධිපති— ශ්‍රී ලංකා යුද්ධ හමුදව.

1973 මාර්තු මස 28 වැනි දින,
යුද්ධ හමුද මූලස්ථානය,
බාලදක්ෂ මාවත,
තැ.පෙ. 553,
කොළඹ 3.

4–282/1—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා යුද්ධ හමුද මූලස්ථානය

1972 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1973 දෙසැම්බර් මස 31 වෙනිද දක්වා වූ කාලය තුලදී ශ්‍රී ලංකා යුද්ධ හමුදවට එලවළු, පලතුරු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිශ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අළුත් මාළු වර්ග සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීමෙන් අනතුරුව, යුද්ධ හමුද ටෙන්ඩර් මණ්ඩලය විසින් තෝරා පත්කර ගන්නා ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, ලිපිනයන්, සැපයීමේ ස්වභාවයන් සහ සේවා ස්ථානයන් මෙසේය :—

| කොන්ත්‍රාත්කරුගේ නම සහ ලිපිනය | සැපයීමේ ස්වභාවය | සේවා ස්ථානය |
|---|---|---|
| වික්‍රමරත්නස් මහත්වරු, අංක 212/49ඊ, ගැස් කර්මාන්ත වීදිය, කොළඹ 11 ... | එලවළු, පලතුරු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිශ්පාදන ද්‍රව්‍ය සැපයීම | පනාගොඩ |
| එම ... | අළුත් මාළු වර්ග සැපයීම ... ... | පනාගොඩ |
| එම ... | එලවළු, පලතුරු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිශ්පාදන ද්‍රව්‍ය සහ මස් වර්ග සැපයීම | තල්ලාඩි |
| එම ... | එම ... | කොඩ්ඩවලි |
| එස්. බී. එන්. ගුණරත්න මහත්මිය, අංක 212/53, බෝධිරාජ මාවත, කොළඹ 11 ... | එම ... | තල්ලාඩි |
| එම ... | එම ... | කොඩ්ඩවලි |
| ඩී. ආර්. රාජපක්ෂ සහ සමාගම, අංක 72, එඩින්බරෝ මාර්කට්, කොළඹ 11 ... | මස් වර්ග සැපයීම ... ... | පනාගොඩ |
| වික්‍රමරත්නස් මහත්වරු, අංක 212/49ඊ, ගැස් කර්මාන්ත වීදිය, කොළඹ 11 ... | එලවළු, පලතුරු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිශ්පාදන ද්‍රව්‍ය, මස් වර්හ සහ අළුත් මාළු වර්ග සැපයීම | කන්තලේ |
| එම ... | එම ... | අනුරාධපුරය |
| එම ... | එම ... | කෑගල්ල |
| එම ... | එම ... | මහනුවර |
| එම ... | එම ... | බූස්ස |
| එස්. බී. එන්. ගුණරත්න මහත්මිය, අංක 212/53, බෝධිරාජ මාවත, කොළඹ 11 ... | එම ... | නුවරඑළිය |
| එස්. එස්. සෙල්වදොරේ මහතා, අංක 83, 1 වෙනි මරදන, කොළඹ 10 ... | එම ... | යාපනය |
| එම ... | එම ... | සිලාවතුරය |
| එච්. ජී. පී. මෙකියස් සිල්වා මහතා, '' සමන්ති '', තේක්කවත්ත, කපුගම, දෙව්නුවර | එම ... | මාතර |
| එම ... | එම ... | වීරවිල |
| එච්. ටී. ජිනදස මහතා, ජයනන්ද හෝටලය සහ බේකරිය, කිලිනොච්චිය ... | එම ... | එලිෆන්ට්පාස් |
| එම ... | එම ... | වෙම්පන්කුණ්ඩු |
| එම ... | එම ... | මුලතිව් |

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුදහමුදධිපති— ශ්‍රී ලංකා යුද්ධ හමුදව.

1973 මාර්තු මස 28 වැනි දින,
යුද්ධ හමුද මූලස්ථානය,
බාලදක්ෂ මාවත,
තැ.පෙ. 553,
කොළඹ 3.

4–282/2—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා යුද්ධ හමුද මූලස්ථානය

1972 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1973 දෙසැම්බර් මස 31 වෙනිද දක්වා වූ කාලය තුලදී ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ බැරැක්ක රෙදිපිළි සහ සෙසු නිළ ඇඳුම් සේදීම සඳහා ටෙන්ඩර් කැඳවීමෙන් අනතුරුව, යුද්ධ හමුද ටෙන්ඩර් මණ්ඩලය විසින් තෝරා පත්කර ගන්නා ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, ලිපිනයන්, සැපයීමේ ස්වභාවයන් සහ සේවා ස්ථානයන් මෙසේය :—

| කොන්ත්‍රාත්කරුගේ නම සහ ලිපිනය | සැපයීමේ ස්වභාවය | සේවා ස්ථානය |
|---|---|---|
| පී. ඩැනී ප්‍රනාන්දු මහතා, හෝකන්දර උතුර, හෝකන්දර ... ... | බැරැක්ක රෙදිපිළි සහ සෙසු නිළඇඳුම් සේදීම ... | ත්‍රිකුණාමලය |
| එම ... | එම ... | මහනුවර |
| එම ... | එම ... | කන්තලේ |
| එම ... | එම ... | කෑගල්ල |
| ඩබ්ලිව්. ඩී. ප්‍රනාන්දු මහතා, බ්‍රැන්ඩියාවත්ත, වැල්ලම්පිටිය ... ... | එම ... | උඩවලවේ |
| එම ... | එම ... | පදවිය |
| එම ... | එම ... | අනුරාධපුරය |
| එම ... | එම ... | වෙම්පන්කුණ්ඩු |
| එම ... | එම ... | වීරවිල |
| පී. එච්. නවරත්න මහතා, අංක 51, මැලේ වීදිය, කොළඹ 2 ... ... | එම ... | නුවරඑළිය |
| එම ... | එම ... | දියතලාව |
| එම ... | එම ... | බූස්ස |
| ඩබ්ලිව්. එම්. ජේම්ස් මහතා, මල්පිටිගෙවත්ත, ඌරුපිටිය, දෙනිපිටිය ... | එම ... | යාපනය |
| ඩී. රණසිංහ මහතා, උඩුපිල, මිරිස්ස ... ... ... | එම ... | එලිෆන්ට්පාස් |
| එම ... | එම ... | මන්නාරම |
| එම ... | එම ... | සිලාවතුරය |
| අන්දිරිස් වෙරගොඩ මහතා, ශාන්ති නිවස, වලහේන, ගනේගොඩ, ඇල්පිටිය ... | එම ... | අම්පාර |
| ආර්. ඩී. ප්‍රනාන්දු මහතා, අංක 3/12, සාලමුල්ල පාර, වැල්ලම්පිටිය ... | එම ... | මාතර |
| සී. පී. කරෝලිස් මහතා, අංක 231, ත්‍රිකුණාමලය වීදිය, මහනුවර ... | එම ... | මුලතිව් |

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද හමුදධිපති— ශ්‍රී ලංකා යුද්ධ හමුදව.

1973 මාර්තු මස 28 වැනි දින,
යුද්ධ හමුද මූලස්ථානය,
බාලදක්ෂ මාවත,
තැ.පෙ. 553,
කොළඹ 3.

4–282/3—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය

1972 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1973 දෙසැම්බර් මස 31 වෙනිද දක්වා වූ කාලය තුලදී ශ්‍රී ලංකා යුද්ධ හමුදවට, ශ්‍රී ලංකා නාවික හමුදවට, ශ්‍රී ලංකා ගුවන් හමුදවට එලවළු, පලතුරු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිශ්පාදන ද්‍රව්‍ය, මස් වර්ග සහ අළුත් මාළු වර්ග සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීමෙන් අනතුරුව ඒකාබද්ධ සේවා ටෙන්ඩර් මණ්ඩලය විසින් තෝරාපත් කර ගන්නා ලද කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, ලිපිනයන්, සැපයීමේ ස්වභාවයන් සහ සේවා ස්ථානයන් මෙසේය :—

| කොන්ත්‍රාත්කරුගේ නම සහ ලිපිනය | සැපයීමේ ස්වභාවය | සේවා ස්ථානය |
|---|---|---|
| වික්‍රමරත්නස් මහත්වරු, අංක 212/49ඊ, ගැස් කර්මාන්ත වීදිය, කොළඹ 11 ... | එලවළු, පලතුරු, පොල්, කිරිපට්ටි සහ ගොවි නිශ්පාදන ද්‍රව්‍ය සැපයීම | කොළඹ |
| එස්. බී. එන්. ගුණරත්න මහත්මිය, අංක 212/53, බෝධිරාජ මාවත, කොළඹ 11 ... | එම ... | දියතලාව |
| ඩී. ආර්. රාජපක්ෂ සහ සමාගම, අංක 72, එඩින්බරෝ මාර්කට්, කොළඹ 11 ... | මස් වර්ග සැපයීම ... ... | කොළඹ |
| වික්‍රමරත්නස් මහත්වරු, අංක 212/49ඊ, ගැස් කර්මාන්ත වීදිය, කොළඹ 11 ... | අළුත් මාළු වර්ග සැපයීම ... ... | දියතලාව |
| එස්. එම්. ඒ. අසීස් මහතා, අංක 116, මහවීදිය, දියතලාව ... ... | මස් වර්ග සැපයීම ... ... | දියතලාව |

ඩී. එස්. ආටිගල,
මේජර් ජනරාල්,
යුද හමුදාධිපති— ශ්‍රී ලංකා යුද්ධ හමුදව.

1973 මාර්තු මස 28 වැනි දින,
යුද්ධ හමුද මූලස්ථානය,
බාලදක්ෂ මාවත,
තැ.පෙ. 553,
කොළඹ 3.

4–282/4—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම්

### බලපිටිය මහෙස්ත්‍රාත් උසාවියේ ප්‍රසිද්ධ වෙන්දේසියක්

මෙහි පහත සදහන් රාජසන්තක කරන ලද හා මෙතෙක් අයිති කරුවන් ඉදිරිපත් වී නොමැති භාණ්ඩ 1973. 04. 27 වැනි දින පෙ. ව. 9 ට බලපිටිය මහෙස්ත්‍රාත් උසාවියේදී ප්‍රාදේශීය උසාවි පාලන ලේකම් ඉදිරිපිට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මහජනයාට මෙයින් දැනුම් දෙනු ලැබේ.

බඩු මිළදී ගන්නන් විසින් එවෙලේම මුදල් ගෙවා බඩු ඉවත් කර ගත යුතුය.

ඩී. එන්. අස්මෝන්,
ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්.

1973 මාර්තු මස 24 වෙනි දින,
බලපිටිය මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

| නඩු අංකය | භාණ්ඩය | |
|---|---|---|
| ඒ787/72 ... | බැරල් ... | ... 1 සි |
| 9343 බී/ඊ ... | කැති ... | ... 1 සි |
| 64130 ... | බැරල් ... | ... 1 සි |
| 58259 ... | බරණි ... | ... 1 සි |
| 68283 ... | වාච්චි ... | ... 1 සි |
| 68431 ... | ගෝනි ... | ... 5 සි |
| 70095 ... | කිරිවින් ... | ... 1 සි |
| 70096 ... | සවරින් සබන් බාර් | ... 1 සි |
| 70266 ... | හිස් අරක්කු බෝතල | ... 5 සි |
| 70267 ... | හිස් අරක්කු බෝතල | ... 1 සි |
| 70269 ... | හිස් අරක්කු බෝතල | ... 12 සි |
| 70310 ... | හිස් අරක්කු බෝතල | ... 2 සි |
| 70331 ... | හිස් අරක්කු බෝතල | ... 1 සි |
| 70341 ... | පොඩි බැරල් | ... 2 සි |
| | ජෑර් ... | ... 1 සි |
| | හිස් අරක්කු බෝතල | ... 1 සි |
| 70410 ... | රබර් කෑන් | ... 1 සි |
| | හිස් අරක්කු බෝතල | ... 1 සි |
| 70411 ... | මැටිකල (බරණි) | ... 1 සි |
| | හිස් අරක්කු බෝතල | ... 1 සි |
| 70426 ... | හිස් අරක්කු බෝතල | ... 1 සි |
| 70731 ... | රබර් කෑන් | ... 1 සි |
| | බැරල් ... | ... 1 සි |
| | හිස් අරක්කු බෝතල | ... 2 සි |
| 70797 ... | රබර් කෑන් | ... 2 සි |
| | හිස් අරක්කු බෝතල | ... 1 සි |
| 70845 ... | පොරෝ ... | ... 1 සි |
| | කුඩා පිහි ... | ... 1 සි |
| අංකයක් නොමැත ... | ලොකු පිප්ප | ... 2 සි |
| අංකයක් නොමැත ... | බාල්දි ... | ... 1 සි |
| අංකයක් නොමැත ... | කැති ... | ... 1 සි |
| අංකයක් නොමැත ... | ඉරුන් කියත් | ... 1 සි |
| අංකයක් නොමැත ... | බැරල් ... | ... 4 සි |

4–278—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

### රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ ඇලබඳ ගුදමෙහි තැන්පත් පහත සඳහන් බඩු 1973 මැයි මස 18 වෙනි දින පෙ. ව. 10:00 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 මැයි මස 15 වෙනි දින එම බඩු ගැණුම්කරුවනට පරීක්ෂා කර බැලීමට පිළිවන.

ඉල්ලීම අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් මිළයට ගන්නා භාණ්ඩයෙහි වටිනාකමින් 50% ක මුදලක් තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

වෙන්දේසි පිළිබඳ අතිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වෙනි දින ගැසට් පත්‍රය බලන්න.

ටී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය. ඒඩී/විකිණීම්/96.
1973 අප්‍රේල් මස 3 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

(1) බෙන්ටොනයිට් මලු 3[illegible]0 සි.
(2) වැල්කම් කුඩු තොග [illegible] සි.
(3) හයිඩ්රේටඩ් ලයිම් මලු 59 සි.
(4) පොලිතීන් කැට (ග්‍රැනියුල්ස්) මලු 32 සි.
(5) අතුගා එකතුකල මිශ්‍ර පොහොර තොග 1 සි.
(6) බෙලෙක් තහඩු කෑබලි තොග 1 සි.

4–309—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

මෙහි පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ 1973 අප්‍රේල් 25 වැනි දින, කොළඹ 7, ඊඩ් මාවතේ, අංක 22 දරන ස්ථානයේ පිහිටි රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුවේදී පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම භාණ්ඩ කාර්යාල වේලාවන් හිදී, ඉහතකී ස්ථානයේදී පරීක්ෂා කළ හැක. බඩු ගැනුම් කරුවන් විසින් ඉල්ලන මිළට ගත් බඩු මුදල් ගෙවා එවෙලේම ඉවත් කර ගත යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ඔරලෝසු මේස ස්මිත් 1
2. උදලු තල 2
3. බයිසිකල් "මොනරා" 1

පීටර්. පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

වර්ෂ 1973 මාර්තු මස 29 වැනි දින,
කොළඹ 7, ඊඩ් මාවතේ,
අංක 22 දරණ ස්ථානයේ,
රාජ්‍ය භාෂා ,පොර්තමේන්තුවේදිය.

4–307—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

### ඡායාරූප උපකරණ විකිණීම

පහත සඳහන් ඡායාරූප උපකරණ කිරුලපනේ පිහිටි රජයේ චිත්‍රපටි අංශයේ වහාම විකිණීම සඳහා තිබේ. ඒවායේ මිළ ගණන් එක් එක් ද්‍රව්‍ය කෙලින් දක්වා තිබේ.

සාමාන්‍ය කායඹාල වේලාවල දී රජයේ චිත්‍රපටි අංශයේ ගබඩාකරුගෙන් මුදල් ගෙවා ලබාගත හැකිය.

| | ද්‍රව්‍ය | තිබෙන ප්‍රමාණය | මිළ |
|---|---|---|---|
| 1. | මිලි මීටර් 35 'ඕර්වෝ' ප්‍රති ඡායාපටි වර්ගය. එන්පී. 27 (ඒඑස්ඒ 400) දල වශයෙන් අඩි 1,000ක් ඇති බඳුන් | අඩි 1,82,000 ... | අඩි 1000ක් රු. 150 බැගින් |
| 2. | ප්‍රති ඡායාපටි සමඟ ඕවර් කැසට් වර්ගය. එන්පී. 20 (අනාවරණ 36 සහිත, ඒඑස්ඒ 80 ඕවර් ප්‍රති ඡායා පටි | කැසට් 8,117 ... | එකක් රු. 5.00 යි |
| 3. | ෂීට් 100කින් යුතු බීඑන් 1 වර්ගයේ සෙන්ටි මීටර් 18 × 24 (7" × 9½") ප්‍රමාණයේ ඕර්වෝ මුද්‍රණ කඩදසි පැකට් | පැකට් 324 ... | පැකට් 1ක් රු. 65 යි |
| 4. | රසායනික විකාශන එෆ්ජ 43 වර්ගයේ පැකට් (එක් පැකට්ටුවකින් ලීටර් 10ක් සාදගත හැකිය) | පැකට් 1,210 ... | පැකට් 1ක් රු. 21 යි |
| 5. | රසායනික විකාශන එන්. 113 පැකට් (එක පැකට්ටුවකින් ලීටර් 10ක් සාදගත හැකිය) ... | පැකට් 1,051 ... | පැකට් 1ක් රු. 20 යි |
| 6. | හයිපො (fපික්සර් ඒ. 300) පැකට් (එක් පැකට්ටුවක සෝඩියම් තයෝ සල්ෆේට් රාත්තල් 3ක් ද, මෙටා බයිසල්ෆේට් අවුන්ස 3ක් හෝ 4ක් ද අඩංගු වේ) | පැකට් 5,565 ... | පැකට් 1ක් රු. 3.00 යි |

ටී. බී. එම්. ඒකනායක,
කොමසාරිස්.

පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,
සී. 45, කප්පෙට්පොල පාර,
කොළඹ 5,
1973 අප්‍රේල් මස 02 වැනි දින.

4–308—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

### සේවයට අයෝග්‍ය ද්‍රව්‍ය විකිණීම

මරදාන, පරණ දුම්රිය වැඩපල භූමියේ, මධ්‍යම ගබඩාවේ (පරණ ර. වැ. දෙ. මධ්‍යම ගබඩාවේ) තිබෙන පරණවූත්, සේවයට අයෝග්‍යවූත් පහත සඳහන් ද්‍රව්‍යයන් 1973 මැයි මස 9 වෙනි බුද දින පෙර වරු 10.00 ට එම භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබනවා ඇත.

2. මෙම ද්‍රව්‍යයන් වෙන්දේසියේ විකුණනු ලබන දිනයේ දී පෙ. ව. 8.00 සිට ඒවා පරීක්ෂාකර බැලීමට පුළුවන.

3. සාධාරන මිළක් නොලැබෙන ද්‍රව්‍යයක් වෙතොත් එය විකිණීම අත්හිටුවනවා ඇත.

4. එක් එක් ද්‍රව්‍ය සඳහා ජයග්‍රාහක මිළ ගණන් ඉදිරිපත් කළ අය තම මිළදී ගත් සියළුම ද්‍රව්‍යයන් සඳහා එතැනදීම සම්පූර්ණයෙන්ම මුදල් ගෙවිය යුතු අතර එම ද්‍රව්‍යයන් එදිනම පස්වරු 3.30 ට පෙර ඉවත් කර ගැනීමට වග බලා ගත යුතුය.

ජේ. සී. පී. ද. එස්. වික්‍රමනායක,
ලේකම් වෙනුවට.

1973 අප්‍රේල් මස 2 වැනි දින,
කොළඹ 1, මහලේකම් කාර්යාලයේ,
වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ දී.

#### ද්‍රව්‍ය ලැයිස්තුව

(1) අලවංගු 4 යි.
(2) වක් පිහි 2 යි.
(3) ගොන් බඳින කරත්ත 1 යි.
(4) කපන කටු 7/8" 1 යි.
(5) කපන තල 2" ද්වි 1 යි.
(6) කපන තල 1½" ද්වි 2 යි.
(7) කපන කටු 10" 2 යි.
(8) කෑති 26" 2 යි.
(9) තෙපැති පීරි 3" 12 යි.
(10) තෙපැති පීරි 5" 17 යි.
(11) ඇඹරුම්ගල් 18" × 3" 1 යි.
(12) උදළු 4 යි.
(13) ඇණ අදිනයන් 1 යි.
(14) සාමාන්‍ය පිත්තල ඉබි යතුරු 1 යි.
(15) අත් අඬු 8" 3 යි.
(16) යේල් ඉබි යතුරු 1" 2 යි.
(17) යේල් ඉබි යතුරු 2" 3 යි.
(18) යේල් ඉබි යතුරු 2½" 1 යි.
(19) දුරකළුන සඳහා වූ කුඩා ඉබි යතුරු 2 යි.
(20) ප්‍රැටොමැක්ස් ඔරිජිනල් ලාම්පු ඉටිපන්දම් 350 1 යි.
(21) ප්‍රැටොමැක්ස් ඔරිජිනල් ලාම්පු ඉටිපන්දම් 350 5 යි.
(22) සංස් පාන් 10" × 12" 2 යි.
(23) අත් කියත් 20" 1 යි.
(24) ඉස්කුරුප්පු නියන් 12" 2 යි.
(25) ඉස්කුරුප්පු නියන් 6" 1 යි.
(26) තහඩු කපන කතුරු 12" 2 යි.
(27) විදුලි කේතල 1 යි.
(28) තීන්ත කූඩු (වීදුරු) 4 යි.
(29) තීන්ත කූඩු (පලාපෙති මෝස්තරය) 7 යි.
(30) තීන්ත කුපයන් (වීදුරු) 4 යි.
(31) සම් බෑග් 1 යි.
(32) පෑන් පිහිය 1 යි.
(33) පෙන් වයිපර්ස් 2 යි.
(34) පෑන් රාක්ක 3 යි.
(35) ජිද්‍රක (සිදුරු දෙක) 2 යි.
(36) පින් සර්ස් (ඩැහි අඬු) 2 යි.
(37) රබර් මුද්‍රා 21 යි.
(38) ලී තීන්ත කූඩු-තීන්ත කුපයන් 2 යි.
(39) අංක. එන් සීඑස්. 69427 දරණ "රැලේ" බයිසිකලය 1 යි.

4–337—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව දැව වෙන්දේසිය**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වයඹ දිසාවේ කුලියාපිටිය අඩවියේ මිල්ල, නැදුන්, කීන, නැටව්, දෙල්, හුරිමාර, මලබඩ, ඇටඹ, කඩුම්බේරිය ආදී කඳන් 111ක් (ඝන අඩි 972.6), ඉරූ ලී කෑලි 2, 1 වැනි පන්තියේ වටලී 4, මිල්ල කම්බි කනු 16 ක් සහ පිහිය 2 ක් 1973 අප්‍රේල් මස 23 වැනි දින පෙ. ව. 10 ට කුලියාපිටිය අඩවි කැලෑ කාර්යාලයේදී මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියට කලින් මෙම දැව හා මෙවලම් බලා සෑහීමකට පත්වන ලෙස සියළුම ඉල්ලුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. වැඩි විස්තර සඳහා කුලියාපිටිය අඩවි වන නිලධාරිගෙන් විමසන්න.

ඩබ්ලිව්. එස්. අබේවර්ධන,
වයඹ දිසා වන නිලධාරි,
කුරුණෑගල.

දිසාකැලෑ කාර්යාලය,
කුරුණෑගල.

4-295—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

---

**දැව වෙන්දේසිය—වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**1973 අප්‍රේල් මස 26 දින පෙ. ව. 10 ට පහත සඳහන් ද්‍රව්‍ය උතුරු මැද දිසාවේ දිසා වන නිලධාරී විසින් අනුරාධපුර අඩවි වන කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—**

ඝන අඩි 398.1 ක ප්‍රමාණයකින් යුත් තේක්ක, හල්මිල්ල, කොහොඹ, බුරුත, පලු, මිල්ල, රාසේ, ගොඩකිරිල්ල, පානක්කු, මාදන් සහ බිටිය යන වර්ග කඳන් 93 යි, ඝන අඩි 119.8 කින් යුත් තේක්ක, බුරුත, පලු හා හල්මිල්ල යනාදී වර්ගවලට අයත් ඉරූ දැව කෑබලි 206 යි, 1 වන පන්තියේ තේක්ක කනු 135 යි, II පන්තියේ තේක්ක කනු 24 යි, I පන්තියේ කනු 54 යි, II පන්තියේ කනු 60 යි, ඝන අඩි 6.1 ක ප්‍රමාණයකින් යුත් ලෑලි 13 යි, කම්බිකනු 11 යි, කියත් 1 යි, පීරි 4 යි, අඬකෝදු 4 යි, කියත් කූට්ටම් 1යි, ලොකු ඉරුම් කියත් 1 යි, අලවංගු 1 යි, කෑති 1 යි, වෑය 1 යි, දත් අඬු 1 යි, ලබ 1 යි, පිහිය 1 යි, තුල්කෑලි 1 යි, ලන්තෑරුම් 1 යි, පාලුගම වන විද්‍යාලයයේ පාවිච්චි කළ ගෙවල් උපකරණ 7'×3' දොර දොරවල් 2 යි, 6'×3'.6" වීදුරු රාමු 1 යි, 6'×3' වීදුරු රාමු 4 යි, අඩි 10 බැගින් දිග ටකරන් කොළ 50 යි, අඩි 4 බැගින් දිග ඇස්බැස්ටෝස් තහඩු 5 යි, අඩි 8 බැගින් දිග ඇස්බැස්ටෝස් තහඩු 35 යි, අඩි 10 බැගින් දිග ඇස්බැස්ටෝස් තහඩු 12 යි, ජනෙල් 4 යි, දොරවල් 2 යි, ඉරූ දැව කෑලි 95 යි, රිප්ප දික් අඩි 300 යි, දිග 6' විෂ්කම්භය 10' ක් වූ ගැල්වනයිස් වතුර ටැංකි 1 යි, මෙම භාණ්ඩ හා දැව සියල්ලම අනුරාධපුර අඩවි වන කාර්යාලයේ ඇත.

වෙන්දේසිය ආරම්භ කිරීමට පෙරාතුව දැව හා භාණ්ඩ පරීක්‍ෂා කර බලනලෙස ඉල්ලුම් කිරීමට බලාපොරොත්තුව සිටින්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන්නන් වෙන්දේසියට අදාළ කොන්දේසිවලට අනුකූලතාවය දැක්විය යුතුය. වෙන්දේසිය පිළිබඳ වැඩිමනත් විස්තර සඳහා පහත අත්සන් කරන අයගෙන් හෝ අනුරාධපුර අඩවි වන නිලධාරිගෙන් ලබාගත හැකිය.

ඈන්. සිත්තම්පලම්,
උතුරු මැද දිසාවේ දිසා වන නිලධාරී.

දිසා වන කාර්යාලය,
ත්‍රිකුණාමලය,
1973.3.24.

4-296—73.04.11 දින අංක 54 දරණ ගැසට් පත්‍රය

---

**ඈන් විමසීම**

පහත සඳහන් සතුන් පල්ලේකැලේ එළිමහන් සිර කඳවුරේ ගොවිපලේදී 1973 මැයි මස 8 වෙනි දින උදේ 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

1 මිශ්‍ර ගෝන් වස්සන් 5 යි.

2. ලොකු සුදු ඌරු පැටවුන් 5 යි.

3. ලොකු සුදු ඊරී පැටවුන් 5 යි.

මෙම සතුන් සතියේ දිනවල පෙ. ව. 8 සිට ප. ව. 2 දක්වාත් සෙනසුරාදා දිනවල පෙ. ව. 8 සිට පෙ. ව. 10 දක්වාත් ගොවිපලේදී බැලිය හැක. සතුන් වෙන්දේසියෙන් මිළදී ගත් වහාම රැගෙන යායුතුයි.

පී. ඩබ්ලිව්. පෙරේරා,
බන්ධනාගාර අධිකාරී.

එළිමහන් සිර කඳවුර,
පල්ලේකැලේ-කුණ්ඩසාලේ,
1973. 03. 22

4-339—73.04.11 දින අංක 55 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් විනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|
| අප්‍රේල් | ... | 73. 4. 6 සිකුරාද | 73. 3.28 බදාදා | දවල් 12.00 |
| | | 73. 4.11 බදාදා | 73. 4. 4 බදාදා | දවල් 12.00 |
| | | 73. 4.19 බ්‍රහස්පතින්ද | 73. 4.11 බදාදා | දවල් 12.00 |
| | | 73. 4.27 සිකුරාද | 73. 4.18 බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.